**පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---

පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරන ණය ගිවිසුමේ I ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, බස්නාහිර, සබරගමුව, නැගෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම හා උතුරු පළාත්වල වාහන මෙහෙයුම්, මාර්ග නඩත්තු පිරිවැය, ගමන් කරන කාලය හා මාර්ග අනතුරු අඩු කිරීම මඟින් අදාළ ප්‍රදේශවල මඟී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායකවීම සඳහා පදික මාර්ග උරහිස් සහිත මං තීරු දෙකකින් යුතුව පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,632 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10 ක් වන අතර පිරිවැය සම්පූර්ණයෙන්ම මූල්‍යායනය කිරීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර, 2018 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණාවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

කොන්ත්‍රාත්කරුවන් මගින් රු.මිලියන 2.32 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද දේපල, පිරියත හා උපකරණ , දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු වෙනුවට කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල | 10.00 | 4,632 | 350 | 0.12 | 59.23 | 0.12 | 59.23 |
| ශ්‍රීලංර | - | - | 9 | 0.02 | 7.60 | 0.03 | 13.65 |
| | 10.00 | 4,632 | 359 | 0.14 | 66.83 | 0.15 | 72.88 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරන ලද පාලම් 25 ක් අතුරින්, කඩුවෙල - බියගම මාර්ගයේ, ගලගෙදර - හොරණ මාර්ගයේ හා කෑගල්ල - බුලත්කොහුපිටිය මාර්ගයේ පාලම් 04 ක ප්‍රතිසංස්කරණ කාර්යයන් පමණක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන විට ඒ සඳහා කිසිදු සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ඉංජිනේරු තනතුරු 02 ක්, ව්‍යාපෘති ඉංජිනේරු තනතුරු 07 ක් සහ කාර්මික නිලධාරී තනතුරු 09 ක් යනාදී ප්‍රධාන තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවති බව නිරික්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව උපදේශකවරුන් තිදෙනෙකු හා මහජන සම්බන්ධීකරණ නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින් එක් එක් තනතුර සඳහා රු.65,000 ක හා රු.25,000 ක මාසික දීමනාවක් සහිතව 2015 දෙසැම්බර් 10 දින ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබූ බව නිරික්ෂණය විය.